GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

19-09-2012

# මාධ්‍ය නිවේදනය

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ෂණ ඒකකයේ අකාර්යක්ෂමතාවය නිසා හම්බන්තොට මහ රෝහලේ වෘත්තිය සමිති ක්‍රියාමාර්යක්

හම්බන්තොට මහ රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු හා හෙද නිලධාරියෙකු අතර මිට මාස 4කට පෙර ඇති වු ගැටළුකාරි තත්ත්වය පිලිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් පවත්වන ලදි. නමුත් මේ වනතුරුත් මෙම පරීක්ෂණය පිලබඳ විමර්ශණ වාර්තාව නිකුත් කොට නොමැති අතර මේ සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හම්බන්තොට ශාඛාව නොසතුට පලකර සිටියි.

යම් කිසි විමර්ශණයක් කල පසු වාර්තා ඉක්මනින් ලබා දීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශණ අංශයේ වගකීම වුවද එම වගකීම පැහැර හරිමින සිටින බවක් දක්නට ඇත. එමෙන්ම විමර්ශන අංශයේ ආකාර්යක්ෂමතාවය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැඩි මතභේදයකට තුඩු දි ඇත.

මේ ආකාරයට විමර්ශණ කටයුතු නිසිආකාරයෙන් සිදු නොකිරීම මගින් රජය අපහසුතාවයට පත්කිරීමේ ක්‍රියාවලියක් තිබේ දැයි සැකයක් පවති. මේ අනුව හම්බන්තොට සිදුවීමට අදාල විමර්ශණ වාර්තාව ලබා දීමට අවශ්‍ය පියවර නොගතහොත් සැප්තැම්බර් 24 වන දින සිට වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට අවතිර්ණය වීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හම්බන්තොට ශාඛාව තිරණය කොට ඇත. මෙම වෘත්තිය සමිති ක්‍රියා මාර්ගය නිසා මහජනතාවට සිදුවන අපහසුතාව වල වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන අංශය භාර ගත යුතුබව අවධාරණය කිරීමට කැමැත්තෙමු.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444